සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

6 ශ්‍රේණිය | **භූගෝල විද්‍යාව** | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 ශ්‍රී ලංකාවේ උතුරු පළාත දිස්ත්‍රික්ක .................................... කින් සමන්විත ය. (3 / 5 / 4)

02 වායුගෝලයේ පවත්නා වායු වර්ග අතරින් ශාක වර්ධනයට වඩාත් වැදගත් වන්නේ ...................................... වායුවයි. (ඔක්සිජන් / නයිට්‍රජන් / හයිඩ්‍රජන්)

03 ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂීන් අතර ................................................................ එක් පක්ෂියෙකි. (වවුලා / ගිරවා / අව්ච්චියා)

04 ශ්‍රී ලංකාවේ තැනිතලා ප්‍රදේශවල ........................................................... වගාව සිදුකරයි. (තේ / පොල් / රබර්)

05 ගෘහ ආශ්‍රිතව සිදුකරන ..................................... කර්මාන්ත ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම දක්නට ලැබේ. (මහා පරිමාණ / කුඩා පරිමාණ / මධ්‍යම පරිමාණ)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 ප්‍රවාහනයේ දී වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම රජය නොමිලේ ලබාදෙන සේවයකි. ( )

07 චිත්‍රයකට වඩා සිතියමකින් භූගෝලීය ලක්ෂණවල පිහිටීම හා දුර ප්‍රමාණය නිශ්චිතව දැක්විය හැකිය. ( )

08 ඝනීභවනය වූ ජලවාෂ්ප වර්ෂණය මගින් පොළවට පතිත වේ. ( )

09 කාලගුණික තොරතුරු දැනගැනීම වඩාත් වැදගත් වන්නේ පාසල් සිසුන්ටයි. ( )

10 බස්නාහිර හා උතුරු දිශාව අතර ඊසාන දිශාව පිහිටා ඇත. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ශ්‍රී ලංකාවේ පළාත් අතරින් වෙරළ තීරයන් හිමි නොවන පළාත මින් කුමක් ද?

(1) උතුරු පළාත (2) වයඹ පළාත (3) සබරගමුව පළාත (4) බස්නාහිර පළාත

12 ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතට අයත් ස්වභාවික වරාය මින් කුමක් ද?

(1) හම්බන්තොට (2) ත්‍රිකුණාමලය (3) ගාල්ල (4) කොළඹ

13 ශාකවලින් පරිසරයට ලැබෙන ප්‍රයෝජනය කුමක්දැයි තෝරන්න.

(1) ඉන්දන ලබාදීම (2) ආහාර හා ඖෂධ ලබාදීම

(3) වායුගෝලය පිරිසිදු කිරීම (4) ගෘහ භාණ්ඩ නිර්මාණයට දැව සැපයීම

14 පාසලක අනන්‍යතාවය දැක්වීමට මෙය අත්‍යවශ්‍ය නොවේ

(1) පාසලේ නම (2) පාසල අයත් ඡන්ද කොට්ඨාසය

(3) අධ්‍යාපන කලාපය (4) අධ්‍යාපන කොට්ඨාසය

15 සිතියමක දක්නට නොලැබෙන ලක්ෂණයකි

(1) ත්‍රිමාණ ස්වරූපයක් ගැනීම (2) වර්ණවත් වීම

(3) පැතලි ස්වභාවය (4) දිශාව දැක්වීම

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16 දරුවා වැඩෙත්ම අධ්‍යාපනය ලබාදෙන විධිමත් ආයතනය වන්නේ ................................................ යි.

17 ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ ..................................................... පිහිටා ඇත.

18 වළාකුළු නොමැති අහස ............................................................... වර්ණයෙන් දිස්වේ.

19 අපට උෂ්ණත්වය හා තාපය ලබාදෙන්නේ ............................................................. යි.

20 මහාමාරිය රෝගය ඇතිකර සත්වයා වන්නේ ......................................................... ය.

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

(01) (අ) පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබේ පාසල පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය ලියන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ කුඩාම හා විශාලතම දිස්ත්‍රික්ක දැක්වෙන අක්ෂර දෙක පිළිවෙලින් ලියන්න. (ල. 02)

(iii) නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්ක අතරින් F අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය කුමක් ද? (ල. 02)

(iv) ශ්‍රී ලංකාවේ පළාත් අතරින් වෙරළ සීමාවක් අයත්වන පළාත් දෙකක් නම් කරන්න. (ල. 02)

(v) දිස්ත්‍රික්ක දෙකක් පමණක් අයත්වන පළාත් දෙකක් නම් කරන්න. (ල. 02)




(ආ) පාසලේ පිහිටීම දැක්වෙන පරිපාලන කොට්ඨාස ධූරාවලිය අනුව පහත සටහනේ හිස්තැන්වලට අදාළ පිළිතුරු ලියන්න. (ල. 06)

පාසල → i. ........................ → ii. ........................ → දිස්ත්‍රික්කය → iii. ........................

02 පහත දැක්වෙන්නේ කාලගුණික අංග මනින උපකරණ කීපයකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




x




y



z

(i) x අක්ෂරයෙන් දැක්වෙන උපකරණය නම් කරන්න. (ල. 02)

(ii) y අක්ෂරයෙන් දැක්වෙන උපකරණයෙන් මනින්නේ කුමන කාලගුණික අංගය ද? (ල. 02)

(iii) z අක්ෂරයෙන් දැක්වෙන උපකරණය නම්කර ඉන් මනින කාලගුණික අංගය ද ලියන්න. (ල. 04)

(iv) x, y, z උපකරණ වලින් මනිනු ලබන කාලගුණික අංග මනින ඒකක පිළිවෙලින් ලියන්න.

x - .................................. y - .................................. z - .................................. (ල. 03)

03 (i) මිනිසා විසින් අවිධිමත් ලෙස භූමිය පරිහරණය කරන අවස්ථා දෙකක් ලියන්න. (ල. 04)

(ii) වරහන් තුළ ඇති වචන යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

(වැසි ජල ටැංකි භාවිතය / පස නිසරු වීම / වාතය / ශාක පැල සිටුවීම / වන විනාශය / ජලය / පාංශු ඛාදනය / ශ්වසන ආබාධ ඇතිවීම / කෘෂිකාර්මික කටයුතු අඩාල වීම) (ල. 07)

| ස්වභාවික පරිසරයේ මූලිකාංග | අවිධිමත් මානව ක්‍රියාකාරකම් | එහි ප්‍රතිඵල | හානිය/දූෂණය අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| 1. ................................ | ජලය අපිරිසිදු කිරීම | 4. ................................ | 6. ................................ |
| 2. ................................ | 3. ................................ | 5. ................................ | 7. ................................ |

04 (i) පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වූ කර්මාන්ත කිහිපයක පිහිටීම පහත සිතියමේ දැක්වේ. ඒ ඇසුරින් දී ඇති හිස්තැන් පුරවන්න. (ල. 08)




(ii) පහත සඳහන් ප්‍රදේශවල වගා කරනු ලබන බෝග වර්ග එක බැගින් නම් කරන්න.

තැනිතලා ප්‍රදේශ -

කඳුකර ප්‍රදේශ -

ගංගා නිම්න ප්‍රදේශ - (ල. 03)

05 (i) පහත දැක්වෙන A, B, C හා D රූප සටහන්වල ඇතුළත් ආගමික ස්ථාන නිවැරදිව හඳුනාගෙන නම් කරන්න. (ල. 04)



A



B



C



D

(ii) ඉහත ආගමික ස්ථානවලට යන ජනතාව අදහන ආගම් පිළිවෙළින් ලියන්න.

A ........................................ B ........................................

C ........................................ D ........................................ (ල. 04)

(iii) ඉහත ආගම් වලින් ඔබ තෝරාගත් ආගම් තුනකට අදාළ ආගමික උත්සව එක බැගින් ලියන්න. (ල. 03)

06 (i) පහත දැක්වෙන භූගෝලීය ලක්ෂණ නිවැරදිව යා කරන්න. (ල. 06)

| | |
|---|---|
| උස්බිම් | |
| උද්‍යාන | මිනිසා විසින් නිර්මාණය කරන ලද ලක්ෂණ |
| මාර්ග | |
| වනාන්තර | |
| ගංගා | ස්වභාවික ලක්ෂණ |
| බෝග වගාවන් | |

(ii) පහත දැක්වෙන සතුන්ගෙන් මිනිසාට ලැබෙන ප්‍රයෝජනය බැගින් ලියන්න. (ල. 05)



A



B



C



D



E

07 පහත දැක්වෙන උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>පහළට</u>

1. සුළඟේ වේගය මනින උපකරණය

3. පළාත් නිර්මාණය වන්නේ මේවා එකතුවීමෙනි.

4. අඩු වේගයකින් හමන සුළං

5. කාලගුණික මූලිකාංගයකි.

7. නැගෙනහිර සහ දකුණු දිශාව අතර පිහිටි දිශාවයි.

8. අධික වර්ෂාව නිසා කඳුකර ප්‍රදේශවල ඇතිවන උපද්‍රවයකි.

<u>හරහට</u>

2. නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්කයකි.

6. ශාක පත්‍රවලින් ජලය වාෂ්පවීම මේ නමින් හඳුන්වයි.

9. මේ මගින් වළාකුළුවල ස්වභාවය හඳුනාගත හැකිය.

10. යම් ස්ථානයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය මේ නමින් හඳුන්වයි.

11. ගොවියාට උපකාරී වන සත්වයෙකි.



**6 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය 2019** **භූගෝල විද්‍යාව**

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 5 (02) නයිට්‍රජන් (03) අවිච්චියා (04) පොල් (05) කුඩා පරිමාණ

(06) ✗ (07) ✓ (08) ✓ (09) ✗ (10) ✗ (11) සබරගමුව පළාත

(12) ත්‍රිකුණාමලය (13) වායුගෝලය පිරිසිදු කිරීම (14) පාසල අයත් ඡන්ද කොට්ඨාසය

(15) ත්‍රිමාණ ස්වරූපයක් ගැනීම (16) පාසල (17) බෞද්ධාලෝක මාවතේ

(18) නිල් (19) සූර්යයා (20) මීයා

(2 x 20 = ල. 40)

## II කොටස

01 (අ) (i) ඔබේ පාසලේ පිහිටීම අනුව ලකුණු දෙන්න. D / E

(ii) C, J

(iii) ත්‍රිකුණාමලය

(iv) නිවැරදි පිළිතුරට ලකුණු ලබාදෙන්න.

(v) වයඹ, සබරගමුව, ඌව, උතුරුමැද

(ආ) (i) ග්‍රාමනිලධාරි කොට්ඨාසය

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

(iii) පළාත

02 (i) උෂ්ණත්වමානය

(ii) වර්ෂාපතනය

(iii) අනිලමානය - සුළඟේ වේගය

(iv) x $^oC$, $^oF$ (සෙල්සියස් අංශක, ෆැරන්හයිට් අංශක)

y මිලිමීටර්

z පැයට කිලෝමීටර්

03 (i) කෘෂි බිම් ව්‍යාප්ත කිරීම / කඳු බෑවුම්වල වගා කිරීම / කෘෂි රසායන ද්‍රව්‍ය බහුලව භාවිතා කිරීම / මැටි කැපීම / අධික ලෙස වැලි ගොඩ දැමීම / හුණුගල් කැඩීම / මැණික් සඳහා පොළව හෑරීම

(ii) 1. ජලය 2. වාතය 3. වන විනාශය

4. කෘෂිකාර්මික කටයුතු අඩාල වීම 5. ශ්වසන ආබාධ ඇතිවීම

6. වැසි ජල ටැංකි භාවිතය 7. ශාක පැල සිටුවීම

04 (i) (1) රදාවඩුන්න (2) පැදුරු (3) පිත්තල භාණ්ඩ (4) අම්බලන්ගොඩ

(ii) නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.

05 (i) A පන්සල B මුස්ලිම් පල්ලිය C කතෝලික දේවස්ථානය D හින්දු කෝවිල

(ii) A බුද්ධාගම B ඉස්ලාම් C කතෝලික D හින්දු

(iii) නිවැරදි පිළිතුරට ලකුණු ලබාදෙන්න.

06 (i) මිනිසා විසින් නිර්මාණය කරන ලද ලක්ෂණ - උද්‍යාන, මාර්ග, බෝග වගාවන්

ස්වභාවික ලක්ෂණ - උස් බිම්, වනාන්තර, ගංගා

(ii) ඇටිකුකුළා - වගාවන්ට හානිකරන ගොළුබෙල්ලන් විනාශ කිරීම.

වේයා - විවිධ අපද්‍රව්‍ය කැබලිකොට ඒවා දිරාපත් වීමට උදව්වේ.

කපුටා - කුණු කසල කා දැමීම

ගැඩවිලා - පස බුරුල් කිරීම හා පස සරුසාර කිරීම

ගිරවා - බීජ ප්‍රචාරණය ආදී

07 <u>පහළට</u>

1. අනිලමානය 3. දිස්ත්‍රික්ක 4. මද සුළං 5. උෂ්ණත්වය

7. ගිණිකොන 8. නායයෑම්

<u>හරහට</u>

2. මඩකලපුව 6. උත්ස්වේදනය 9. නිරීක්ෂණය 10. කාලගුණය

11. ගවයා